කාන්තාවක් සම්බන්ධ වන යම් කිසි පුවතක් ඉදිරිපත් කිරීමේදී ඇතැම් මාධ්‍ය එම කාන්තාවගේ බාහිර ස්වරූපය සඳහන් කිරීම හෝ භාවාතිෂය ලෙසින් ඉදිරිපත් කිරීම දැකිය හැකි කරුණකි. බොහෝ අවස්ථාවන් වලදී එය සිදුවන්නේ "රූමත්", "සුරූපී" වැනි විශේෂණ පද භාවිතා කරමින් වෙයි. මෙය ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් කාන්තාව කොන් කිරීමකි.

"නීතිඥවරයෙකුගේ සුරූපී බිරිය පැහැර ගැනීමට තැත් කරලා" යනුවෙන් දිවයින (03/09) පුවත්පතේ පළ වූ පුවත ඉහත ආචාර ධාර්මික ගැටළුවට උදාහරණයකි. කෙසේ නමුත්, මෙම ප්‍රවෘත්තියට එම කාන්තාවගේ බාහිර ස්වරූපය ඍජුවම අදාළ වන්නේ කෙසේද යන්න ගැටළුවකි. අනෙක් අතට, මෙවැනි සිදුවීමක් පිරිමියෙකු සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී මාධ්‍යයක් එම පිරිමියාගේ බාහිර ස්වරූපය ඉස්මතු කරන අවස්ථා දැකීමට නොහැකි වීමද ගැටළුවකි. එසේ නම්, මෙසේ එම කාන්තාවගේ "සුරූපී" බව සහ "ළාබාල බව" පවා ඉස්මතු කොට දක්වන්නේ, පුවතට භාවාතිෂය බවක් ලබාදීමට, ඒ ඔස්සේ වැඩි පාඨක ආකර්ෂණයක් ලබාගැනීමට නොවන්නේද? එය කාන්තාව කොන්කිරීමක් මෙන්ම මාධ්‍ය ආචාර ධාර්මික ගැටළුවක්ද නොවන්නේද?

#MediaEthicsSL #lkr #Divaina